NALANDA VIDYALAYA COLOMBO 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

| 09 ශ්‍රේණිය | ගණිතය | 24 ඒකකය |
|---|---|---|

## සම්භාවිතාව

## I - කොටස.

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. දාදු කැටයක් උඩදැමීමේදී ලැබිය හැකි නියැදි අවකාශය ලියා දක්වන්න.

02. සමසේ භව්‍ය ප්‍රතිඵල සහිත පරීක්ෂණයන් සඳහා උදාහරණ 3ක් ලියන්න.

03. සමසේ භව්‍ය ප්‍රතිඵලයක සම්භාවිතාව සෙවිය හැකි සූත්‍රය ලියා දක්වන්න.

04. සමබර දාදු කැටයක් උඩදැමීමේ පරීක්ෂණයේදී ඔත්තේ සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව ලියන්න.

05. පෙට්ටියක රතු බෝල 2ක් ද, නිල් බෝල 3ක් ද, ඇත. ඉන් එක් බෝලයක් ඉවතට ගැනීමේ පරීක්ෂණයේ නියැදි අවකාශය හා එහි අවයව ගණන ලියන්න.

06. මල්ලක රතු බොත්තම් 2ක් ද, අනෙක් මල්ලේ කළු බොත්තම් 2ක් ද, ඇත. දෙකෙන්ම බොත්තම් 2ක් ඉවතට ගැනීමේදී ලැබිය හැකි නියැදි අවකාශය ලියා දක්වන්න.

---

## II - කොටස.

01. සසම්භාවී පරීක්ෂණයක් යන්න පැහැදිලි කර ඒ සඳහා උදාහරණ 3ක් ලියා දක්වන්න.

02. දාදු කැටයක් උඩ දමා ලැබිය හැකි ප්‍රතිඵල ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   i. ලැබිය හැකි සියලුම ප්‍රතිඵල ඇතුළත් නියැදි අවකාශය ලියන්න.
   ii. n (S) සොයන්න.
   iii. ප්‍රථමක සංඛ්‍යාවක් වැටීමේ සම්භාවිතාව A නම්, A හි අවයව ලියන්න.
   iv. n (A) ලියා දක්වන්න.

03. සර්වසම කාඩ්පත් 20ක 1 - 20 දක්වා අංක යොදා ඉන් අහඹු ලෙස කාඩ්පතක් ගැනීමේ පරීක්ෂණයකදී
   i. අංක 15 සහිත කාඩ්පතක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.
   ii. ඉරට්ටේ සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.
   iii. ත්‍රිකෝණ සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.
   iv. සමචතුරස්‍ර සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.
   v. සමචතුරස්‍ර සංඛ්‍යාවක් වන ඉරට්ට සංඛ්‍යාවක් ලැබීමේ සම්භාවිතාව සොයන්න.

EXAMRESULTS.LK